උහන ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උහන ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී කර්මාන්ත ණයගැතියන් යටතේ වැඩියෙන් ගිණුම්ගත කර තිබූ රු.1,001,348 ක වටිනාකම ප්‍රාග්ධන ලැබීම් ගිණුමට බැර කර තිබුණි.	ඉදිරි ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ ගෙවිය යුතු ජීවන වියදම්, සහරා මිලදී ගැනීම සඳහා දීමනා, අතිකාල වැඩ සඳහා දීමනා, ඉන්ධන දීමනා සහ පුස්තකාල පොත් මිලදී ගැනීම් වටිනාකම එකතුව රු.1,069,978 ක් හඳුනාගෙන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරි ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සියලු වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2024 වර්ෂයට අදාළව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු අවසන් ගිණුම් තුළ හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සියලු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විෂයයන් 07 කට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඉදිරිපත් කළ උපලේඛන මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් අතර රු. 6,637,411 ක වෙනසක් පැවතුණි.	ලේඛන යාවත් කාලීන කිරීමට කටයුතු කරන බව.	නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.2,594,778 ක් වූ ගිණුම් විෂයන් 04 කට අදාළව ශේෂ සනාථ කිරීම්, උපලේඛන හා සේවක ඇප ලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	මෙම අගයන් සනාථ කර ගැනීම සඳහා තොරතුරු සොයා ගැනීමට නොහැකි බව.	ශේෂ නිරවුල් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම්	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති			
(i) 5 (xii) රීතිය	මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	නිලධාරීන්ගෙන් අදාළ චක්‍ර ලේඛන අනුව ඇපකර ලබා ගැනීමට කටයුතු කරන බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) 33 රීතිය	වරිපනම් බදු මුදල් පැහැර හරින්නන් පිළිබඳ ලැයිස්තු පිළියෙල කර දේපල තහනම් කිරීම කෙරෙහි සභාවේ ප්‍රමාණවත් අවධානය යොමුව නොතිබුණි.	හිඟ බදු ගෙවීමට ඇති අය හඳුනාගෙන ජංගම සේවා මගින් වරිපනම් බදු එකතු කිරීමටත් එමගින් බදු ගෙවීම පැහැර හරින්නන්ගේ දේපළ තහනම් කිරීමටත් කටයුතු සූදානම් කර ඇති බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(iii) 59 සහ 67 රීති	සෑම වර්ෂයකම ආරම්භයේ දී ආදායම් පරීක්ෂක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද්දා වූ නිලධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා වෙළෙඳ ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී වෙළඳ ව්‍යාපාරය සහ කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iv) 218 රීතිය	සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී එම ප්‍රකාශය සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.740,544 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,559,586 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	ආදායම් ප්‍රභවය	2024				2023			
		ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
i.	වරිපනම් හා බදු	5,686,931	5,725,962	3,188,463	7,029,869	3,244,785	2,108,779	1,901,676	4,492,369
ii.	කුලී	10,813,200	6,291,479	6,246,845	376,941	13,476,200	5,225,212	5,056,778	332,308
iii.	බලපත්‍ර ගාස්තු	1,011,000	599,500	599,500	-	1,451,000	519,500	519,500	-
iv.	වෙනත් ආදායම්	1,807,000	1,887,021	1,887,021	-	2,507,000	3,586,267	3,586,267	-
	එකතුව	**19,318,131**	**14,503,962**	**11,921,829**	**7,406,809**	**20,678,985**	**11,439,758**	**11,064,221**	**4,824,677**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු හිඟ වරිපනම් බදු වටිනාකම රු.7,029,869 ක් වූ අතර එය වර්ෂයට අදාළ තක්සේරු වටිනාකම වන රු.4,287,951 ට සාපේක්ෂව දෙගුණයකට ආසන්න වටිනාකමක් විය.	කාර්තු දැන්වීම් නිකුත් කර හිඟ එකතු කිරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කඩ කුලී ආදායම රු.376,941 ක් වූ අතර එයින් රු.332,307 ක් වසර 01 සිට වසර 07 දක්වා කාලයක සිට අයකර ගත යුතුව පැවතුණි.	ඇප තැන්පත් කොට ඇති තැන්පත් මුදල කඩ කුලී සඳහා අය කොට ගෙන ඉතිරිව පවතින හිඟ මුදල සම්බන්ධයෙන් ඉදිරියේදී සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු වටිනාකම රු.953,789 ක් විය.	මේ වන විට හිඟ ආදායම් කොටසක් ලැබී ඇති බව.	හිඟ මුදල් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණි.	පැනවිය යුතු අතුරු ව්‍යවස්ථා හඳුනා ගෙන ඒවා සකස්කර ඉදිරියේදී අනුමත කර ගැනීමට කටයුතු කරන බව.	අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු නීත්‍යානුකූල කරගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාව සතුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් නොපවතින අතර සමාලෝචිත වර්ෂය තුළ රු. 526,457 ක් වැයකර රැස්කළ කසල අම්පාර නගර සභාව සතු කසල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කර තිබුණි. මේ අනුව ප්‍රාදේශීය සභාව සඳහා වෙන් වූ කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම කෙරෙහි සභාවේ අවධානය ප්‍රමාණවත් පරිදි යොමුව නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් මඟින් ඉඩමක් වෙන්කර ගැනීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී කසළ කළමණාකරණ මධ්‍යස්ථානයක් පිහිටු වීමට කටයුතු කරනු ලබන බව.	කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය සඳහා 2016 වර්ෂයේ ලැබී තිබූ රු.1,789,907 කින් සභාව විසින් කොන්ත්‍රාත්කරුට රු.1,314,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. මහජනතාවගේ විරෝධය හේතුවෙන් මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකර අත්හැර තිබූ නමුත් එම අත්තිකාරම් මුදල වර්ෂ 07 කට අධික කාලයක සිට ගිවිසුම්කරුගෙන් ආපසු ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී පියවා ගැනීමට කටයුතු කරන බව.	අත්තිකාරම් මුදල කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවට අයත් සුසාන භූමි 44 ක හා ක්රීඩා පිටි 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	මෙම ඉඩම් දැනට සභාව නමට පවරා ගැනීමට කටයුතු කරමින් සිටින අතර ඒවා පවරාගත් පසු තක්සේරු කර ගිණුමට ගැනීමට කටයුතු කරන බව.	වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සභාව සතුව පවතින රථවාහන 10 ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි වාහන අදාළ ආයතන වෙත ලබා දී වෙන්දේසියේ විකිණීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම වාහන වෙන්දේසි කිරීමට කිහිපවිටක්ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) වෙත දැනුම් දී ඇති බව.	වාහන වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඇ)	සභාව භාරයේ පවතින වාහන 05 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	වාහන දෙකක අයිතිය මාරු කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලබන අතර ඉතිරි වාහන සඳහා M.T.A. 06 පෝරමය සම්පූර්ණ කර ගැනීමට නොහැකි බැවින් පවරා ගැනීමේ කටයුතු නතර වී ඇති බව.	මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විමසා සභාව භාරයේ පවතින වාහනවල අයිතිය සභාව නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 08 ක පුරප්පාඩු 14 ක් පැවතුණි.	සභාවේ පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇති බව.	කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.5 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතුව භාවිත තත්ත්වයේ පවතින වාහන 17 ක් සඳහා ආදායම් බලපත්ර හා රක්ෂණ සහතික ලබා ගැනීමට සභාව විසින් කටයුතු නොතිබුණි.	සභාවේ ආදායම් තත්ත්වය සැලකිල්ලට ගෙන ඉදිරියේ දී රක්ෂණ සහතික හා ආදායම් බලපත්ර ලබා ගැනිමට කටයුතු කරන බව.	අදාල වාහන සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගැනීමට පියවර ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ ප්‍රමාණවත් නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රමාණවත් නිර්දේශ සකස් කිරීමට කටයුතු කරන බව.	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.2 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ කාර්තුවකට එක බැගින් රැස්වීම් 04 ක් සහ 2025 වර්ෂයේ පළමු කාර්තුවට අදාළව එක් රැස්වීමක් පවත්වා ඇති බව.	විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර සහ රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය.

4.3 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ අයවැය ගත ආදායම් හා සත්‍ය ආදායම් පරීක්ෂාවේදී ආදායම් විෂයන් 06 ක සියයට 01 සිට සියයට 44 දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය මූල්‍ය මඟපෙන්වීමක් ලෙස භාවිතා කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අයවැය ලේඛනය මූල්‍යමය මඟ පෙන්වීමක් ලෙස භාවිතා කළ යුතුය.

4.4 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු සහ පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර එමඟින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	තිරසාර සංවර්ධන පරමාර්ථ හා අරමුණු මුල් කරගෙන සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබන අතර ඒ අනුව හඳුනාගත් ව්‍යාපෘති සහා අරමුදලින් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති වලින් ක්‍රියාවට නන්වනු ලබන බව.	චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර එමඟින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලැසීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය.